# 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (Recovery Plan for Learning Loss - 2022)

## - 10 ශ්‍රේණිය

(10 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

පළමු වාරය

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| **10 ශ්‍රේණිය තුන්වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |
| | දේව ස්වරූපය හා සමානකම දරන මිනිස් ජීවිතය සුරැකීමට කැපවෙයි. | • පස්වන පණතට අනුව ඉටු කළ යුතු හා පිටුදැකිය යුතු දෑ වගුගත කරයි.<br>• මිනිස් දිවිය දෙවියන් වහන්සේට පමණක් අයිති බව පිළිගනියි.<br>• පස්වන පණතට අනුව ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි<br>• මිනිස් දිවිය සුරකියි.<br>• අන් අයගේ ජීවිතවලට ගරු කරයි | • මිනිසාගේ උතුම්කම - දේව ස්වරූපය හා සමානකම (උත්පත්ති 1/27 - 28)<br>• ජීවන හුස්ම ලැබීම (උත්පත්ති 2/7)<br>• ජීවිතයට ගරු කිරීමේ වැදගත්කම(ක.ස.ධ. 2259 - 2 62)<br>• තම ජීවිතය සුරැකීම - මත්ද්‍රව්‍ය, මත්පැන්, දුම්වැටි (ක.ස.ධ. 2288 - 2291)<br>• පස්වන පණතට විරුද්ධව ක්‍රියාකරන අවස්ථා<br>මිනිස් ඝාතන ,වාර්ගික සමූල ඝාතන,<br>ගබ්සාව ,සියදිවි නසා ගැනීම , මානසික හා<br>ශාරීරික වධ හිංසා ,සිරගත කිරීම, රටින් | | 18 පාඩම - **මානව සම්පත සුරකිමු** | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | | පිටුවහල් කිරීම, දරුවන් හා ස්ත්‍රීන් විකිණීම,<br>ගණිකා වෘත්තිය, වහල්භාවය ,<br>ශ්‍රමය සූරාකෑම,<br>චරිත ඝාතනය<br>• ගබ්සාව (ක.ස.ධ. 2270 - 2275)<br>• සියදිවි නසා ගැනීම (ක.ස.ධ. 2280 - 2283) | | | |
| | සිතින් හා කයින් නිර්මල දිවි පෙවෙතක් ගත කරයි. | • භය හා නවය පණත් අනුව ජීවත් වන ආකාරය ගොනු කරයි.<br>• භය හා නවය පණත් ආරක්ෂා කර ගැනීමට සිත පාලනය කර ගත යුතු බව පිළිගනියි.<br>• භය හා නවය පණත් අනුව ජීවත් වන ආකාරය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• සිතින් හා ක්‍රියාවෙන් පිරිසිදු ජීවිතයක් ගත කරයි.<br>• අන් අයට ශුද්ධවන්ත පිවිතුරු ජීවිතයක් ගත කිරීමට උදව් කරයි. | • ව්‍රත ශුද්ධිය (ක.ස.ධ. 2337 - 2345)<br>• ව්‍රත ශුද්ධියට විරුද්ධ ක්‍රියාවන්<br>1. රාගය (ක.ස.ධ. 2351)<br>2. ස්වයං වින්දනය ( ක.ස.ධ. 2352)<br>3. කාම මිත්‍යාචාරය (ක.ස.ධ. 2353)<br>4. අසභ්‍ය පතපොත හා දර්ශන , අසභ්‍ය වචන භාවිතය (ක.ස.ධ 2354)<br>5. ගණිකා වෘත්තිය (ක.ස.ධ. 2355)<br>6. ස්ත්‍රී දූෂණ (ක.ස.ධ. 2356)<br>7. සමලිංගික සේවනය (ක.ස.ධ. 2357 - 2359)<br>8. විවාහ පොරොන්දු සුරැකීම (ක.ස.ධ. 2364 - 2365) | | 19 පාඩම - **නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝය** | 2 |
| | ජාතියේ සමාජීය හා ආර්ථික වර්ධනයට රුකුලක් වන මානව සම්පත් සංවර්ධනයේදී පෞද්ගලික දේපල කාර්යක්ෂමව භාවිත කරයි. | • පෞද්ගලික දේපල පිළබඳ ව ශුද්ධ වූ සභා ඉගැන්වීම් ගොනු කරයි.<br>• මිනිසා දේපල සඳහා නොව දේපල දෙවියන් වහන්සේ ලබා දී ඇත්තේ, මිනිසාට සේවය කිරීම සඳහා බව පිළිගනියි. | • පෞද්ගලික දේපල පිළිබඳ කිතුණු සභා ඉගැන්වීම් (ක.ස.ධ. 2402 - 2406)<br>• අන් අයගේ දේපළ සුරැකීම (ක.ස.ධ. 2408 - 2414)<br>• දුප්පතුන්ට ප්‍රේම කිරීම (ක.ස.ධ 2443 - 24491 ජොහාන් 3/17, ක.ස.ධ. 2534) | | 20 පාඩම - **පෞද්ගලික දේපල ස්වර්ගීය සම්පත් සඳහා** | 2 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • ශුද්ධ වූ සහා ඉගැන්වීම් අනුව, පෞද්ගලික දේපල නිවැරදිව පරිහරණය කිරීම හා එහි ආදීනව පිළිබඳ ව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• පෞද්ගලික දේපල පරිහරණය කිරීමේ දී පරාර්ථකාමී ව ක්‍රියා කරයි.<br>• පෞද්ගලික දේපලවලින් අන් අයට උදව් කරය | | | | |
| | සත්‍යයට සාක්ෂි දරමින් සදාචාර සම්පන්න ජීවිතයක් ගත කරයි. | • සත්‍යගරුක සමාජයක් ගොඩනැගීම සඳහා දායක විය හැකි ආකාර පිළිබඳ තොරතුර ගොනු කරයි.<br>• සැමවිට ම සත්‍යවාදී විය යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• සත්‍යයට සාක්ෂි දරයි.<br>• අන් අයගේ රහස් රකියි. | • සත්‍යය තුළ ජීවත්වීම (ක.ස.ධ 2465 - 2470)<br>• සත්‍යයට සාක්ෂි දැරීම (2471 - 2474)<br>• 8 වන පණතට විරුද්ධ පාපයන් (ක.ස.ධ. 2475 -2487)<br>• රහස් රැකීමේ අවශ්‍යතාවය (ක.ස.ධ. 2491) | | 21 පාඩම - **සත්‍යගරුකව ජීවත් වෙමු** | 2 |
| යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනිය | ජනවන්දනා වර්ෂය තුළ සමරන දේව අභිරහස් ජීවත් කරවයි. | • ජනවන්දනා වර්ෂය පිළිබඳ තාරතුරු ගොනු කරයි.<br>• ජනවන්දනා චක්‍රයේ ඇති මංගල්‍යයන් අර්ථවත් ව පැවැත්විය යුතු බව පිළිගනියි.<br>• ජනවන්දනා වර්ෂය තුළ අඩංගු මංගල්‍යයන් වගුගත කර, නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ජනවන්දනා වර්ෂය තුළ දේව අභිරහස් අර්ථවත් ව සමරයි. | • ජනවන්දනා සමයේ එක් එක් කාලයන් විස්තර කිරීම<br>• එක් එක් සමයට අයිති වර්ණ හා ඒවායේ අර්ථ පැහැදිලි කිරීම. | | 22 පාඩම - **ජනවන්දනා වර්ෂය** | 2 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • කණ්ඩායම් තුළ ප්‍රේමයෙන් කටයුතු කරයි. | | | | |
| | දිව්‍ය පූජාව කිතුනු ජීවිතයේ කේන්ද්‍රය කර ගනියි. | • දිව්‍ය පූජාවේ පිළිවෙත් හතර පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• දිව්‍ය පූජාවට නිසි සූදානමකින් සහභාගිවීමට කැමැත්ත පළ කරයි.<br>• දිව්‍ය පූජාවේ එක් එක් පිළිවෙතේ අනු කොටස් පිළිබඳ ව සකස් කරන ලද වාර්තාව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දිව්‍ය පූජාවට භක්තියෙන් සහභාගි වෙයි.<br>• කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | • දිව්‍ය පූජාවේ එක් එක් පිළිවෙතේ අනුකොටස් වල අර්ථ විස්තර කිරීම. | | 23 පාඩම - **දිව්‍ය පූජාව** | 3 |
| | කිතුනු සහා සමගිය වෙනුවෙන් කැපවෙයි. | • උත්තම පූජක යාච්ඤාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• කිතුනු සභා සමගිය වෙනුවෙන් කැපවිය යුතු බව පිළිගනියි.<br>• කිතුනු සභා සමගිය පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් එළි දක්වයි.<br>• පිළිගත් සභා සමග සමගියෙන් කටයුතු කරයි. | • ජුවාම් 17 පරිච්ඡේදය<br>• උත්තම පූජක යාච්ඤාව තුළින් ජේසුස් වහන්සේගේ දූත සේවාව කැටිකර ඇත.<br>• උත්තම පූජක යාච්ඤාවේ කොටස් 3කි.<br>1. කොටස - තමන් වහන්සේ වෙනුවෙන් යාච්ඤාව<br>(ජුවාම් 17/1 - 5)<br>2. කොටස - ශ්‍රාවකයන් වෙනුවෙන් යාච්ඤාව<br>(ජුවාම් 17/6 - 19) | | 24 පාඩම - **උත්තම පූජක යාච්ඤාව** | 2 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • එක ම සභාවක් ගොඩනැගීමට ක්‍රියා කරයි. | 3. කොටස - අනාගත සභාවේ එකමුතුකම<br>වෙනුවෙන් යාච්ඤාව (ජුවාම් 17/ 20 - 26)<br>• කිතුනු සභා එකමුතුව සඳහා කටයුතු කිරීමේ<br>අවශ්‍යතාව<br>• පිළිගත් සභා 7හි නම්<br>• දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ප්‍රකාශන 2ක් කිතුනු සභා සමගිය වෙනුවෙන් නිකුත් කර ඇත.<br>• කිතුනු සභා සමගි සතිය (ජනවාරි 18 - 25)<br>• කිතුනු අපේ අරමුණු එකම සභාවක් ගොඩනැගීමයි. | | | |
| | යාච්ඤාවෙන් සවිය ලබා දුර්පරීක්ෂා ජය ගනියි. | • මල් උයනේ යාච්ඤාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤාව තුළින් අභියෝග ජය ගැනීමට ශක්තිය ලබාගත් බව පිළිගනියි.<br>• යාච්ඤාවෙන් සවිය ලබා දුර්පරීක්ෂාවෙන් ජය ගන්නආකාරය පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් කරයි.<br>• ජීවිතයේ සෑම අවස්ථාවක දී ම යාච්ඤාවෙන් සවිය ලබා ගනියි. | • මාර්ක් 14/32 - 42<br>• ගෙත්සෙමනෙහි පිහිටීම.<br>• මල් උයනේ යාච්ඤාවේ කරුණු 3ක් පෙන්නුම් කරයි.<br>1. ජේසුස් වහන්සේගේ සැබෑ මනුෂ්‍යත්වය<br>2. දෙවියන් වහන්සේ හා ක්‍රිස්තුන් වහන්සේ අතර<br>ඇති සබැඳියාව<br>3. උන්වහන්සේගේ දුක් ප්‍රාප්තිය<br>• ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤාව තුළින් අභියෝග ජයගැනීමට ශක්තිය ලබාගත් සේක. නමුත් අපෝස්තුලුවරු යාච්ඤාවෙන් ශක්තිය ලබා නොගත් නිසා පරීක්ෂාවට | | 25 පාඩම - **මල් උයනේ යාච්ඤාව** | 2 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | • කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වේ. | වැටීම. (පලායාම, කණ කපා දැමීම, නාදුනන බව පැවසීම) | | | |
| එකතුව | | | | | | 18 |